
# ආදරණීය පූස්පැටියා



ජයලි තරුල්‍යා චන්ද්‍රසිරි

# ආදරණීය පූස්පැටියා

ISBN 978-624-206-721-6

කෘතිය පළ කරන දිනය - 2023.11.25

කතෘගේ වෙනත් කෘති - දැගකාර හා පුංචා

- අහංකාර සරුංගලය

# පිදුම

නිරන්තරයෙන් ඇස ගැටෙන අහස ,සඳතරු, තුරුලතා, ඇළ දොළ , සතා සිව්පාවුන්, හා බැඳුණු සොබාදහමේ සරල සිදුවීම් දෙස මතුපිටින් නොපෙනෙන ගැඹුරු අරුතක් දකින්නට මා යොමුකරන ආදරණීය තාත්තාට,

ඉගෙනීමේ, පොතපතේ අගය කියාදෙමින් අධ්‍යාපනයෙන් දිවිය ජයගත් දියණියක් කරන්නට දිවා රෑ මා වෙනුවෙන් වෙහෙසෙන සෙනෙහෙබර අම්මාට,

පොතපතට, කලාවට, ක්‍රීඩාවට මා යොමුකරමින් ඒ තුළින් ලොවම ජයගත් මහමායාවියක් කරන්නට මා හට ගුරුහරුකම් ලබාදෙන නිති අපගැන සිතන සමන්මලී ගුරු මෑණියන්ටත්,

මාගේ දඟකාර මල්ලියාටත් මෙම පොත සෙනෙහසින් පුදමි.

# ස්තූතිය

මෙම පොත ලිවීමට නන් අයුරින් මා හට  උදව් උපකාර කළ වදනකින් හෝ ශක්තියක් වූ, මා දිරමත් කළ  සියලු දෙනාටම තුති පුදමි.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ පලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහුවිධි කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේම පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරනය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථ කරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛන අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සිවිශේෂ ජයග්‍රහනයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් **''දිවිය දිනන විද්‍යුත් පොතක් ''** ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශය අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක් '' ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට, අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය , ගුරු භවතුන් , දෙමාපියන්, ආදිශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදවු උපකාර කළ සැමට හෘදයංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනවිරත්න මහලේකම් මහතාගේ සේවය ද අගයමි.

**ශශිකලා සේනාධීර ,**

**විදුහල්පතිනිය,**

**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.**

**2023-10-20**

# ආදරණීය පූස් පැටියා

මගේ නම ජයලි හැබැයි හැමෝම මට ආදරේට කියන්නෙ ''දෝනි '' ඔන්න එක දවසක් මම අම්මත් එක්ක පාසල ඇරිලා එද්දී පාර අයිනෙන් පොඩි කෙඳිරිලි හඬක් ඇසුනා. මම වටපිට බලමින් විපරමින් ඒ හඬට කන් දුන්නා. පාර අයිනේ වතුසුද්ද මල් ගහ යට පුංචි වලිග පොඩ්ඩක් නටවමින්  ඤාවි ඤාවි හඬ නගමින් සිටි සුදු පාට පුංචිම පුංචි පූස් පැටියෙක් කොච්චර පුංචිද කියනවනම් උදේට අපේ මිදුලේ අඹ ගසේ තියන කුරුලු ලෑල්ලෙ ටිං ටිං ගාමින් බත් ඇට ගිල දමන ලේන් පැටියා වගේ.

'' අනේ චූටි පූස් පැටියෙක් '' මට ඉබේටම කියවුණා. ඒ වචන කිහිපය ඉවර වෙනකොටම මම හිටියේ පූස් පැටියා ළඟ.



''අම්මේ අපි මේ පූස් පැටියා ගෙදර ගෙනියමු ද? '' මම ඇසුවා ''මෙයා කවුරුහරි මෙතන දාලා ගිහිල්ල වෙන්න ඇති තවම හරියට ඇස් ඇරලත් නැහැනෙ කොහොමද මෙච්චර පුංචි එක්කෙනෙක් අපි හදා ගන්නෙ''.

'' අනේ අම්මේ මම බොන උදේ කිරි එක මම මෙයාට දෙන්නම් අපි මෙයා අරන් යමුකො'' මගේ කරදරේනම් අඩුවක් නැතිවුණා.

''හෙට මගේ උපන්දිනේට මෙයා තෑග්ගක් විදිහට දෙනව ද ?''

එදානම් අම්මට මාත් එක්ක දිනන්න බැරිවුනා මම පූස් පැටියා තුරුලු කරගෙන ගෙදර අරගෙන ආවා. දන්නවද එයාගෙ නම තමයි සුකී.

ඔන්න එදා ඉඳන් මගේ දින සටහනට තවත් වැඩ  කොටසක් එකතු වුණා. ඒ තමයි මගේ පුංචි පූස් පැටියාගේ වැඩ දැන් ඉතින් මම හරිම කාර්යබහුලයි වෙලාවකට අම්මාගෙන් බැනුම් අහන්නේ නැතුවාමත් නෙවෙයි දවසක් මගේ බත් එකේ තිබුණ මාලු කෑල්ල මම පූස් පැටියට දීලා අම්මගෙන් දෝස්මුරයයි හැබැයි එදා ඉඳන් අපේ ගෙදර හදන හැම කෑමක්ම හතරදෙනෙකුටම හදනවා. අම්මයි, තාත්තයි, පූස්පැටියයි, මමයි.



පූස්පැටියත් එක්ක මගේ ගෙවෙන හැම දවසක්ම හරිම ලස්සනයි.

දැන් එයා පුලුන් බෝලයක් වගේ ලස්සනයි මම උදේ ඉස්කෝලෙ යනවිට එයා මං දිහා හරිම දුකින් බලාගෙන ඉන්නවා. හැබැයි ආයෙ දවල් ගෙදර එනකොටනම් කොඩියක් වගේ වලිගය ඔසවාගෙන පුරු පුරු ගාමින් මගේ කකුල් දෙකේ පැටලෙනවා, මම යන පස්සෙන්ම දුවගෙන එනවා.


මම සමහර දවසට අම්මාගෙ සාරියක් ඇඳගෙන ගෙදරට ටීචර් වෙනවා එතකොට එයා තමයි ළමයා  හැබැයි ළමයා කියනදෙයක් අහන්නෙම නෑ. මම එහෙට මෙහෙට යනකොට මගේ සාරි පොටට කුරුමානම් අල්ලමින් ඒකට පැනලා බිම පෙරළෙනවා.



ඔන්න ඔහොම ටික කාලයක් ගත වුණා. එදා ඉරිදා දවසක් අපේ ගෙදර හැමෝම ඉන්නවා. හොඳින් ඉරපායා තිබුණා. හැබැයි පරිසරයනම් හරිම නිසොල්මන් අම්මා හැම ඉරිදාම වගේ එදත් වෙරන්ඩා එකේ තිබුණු මල් පැළ වලට වතුර දාන්න කියලා මට කිව්වා මම පුංචි මල් බාල්දියකට වතුර අරගෙන එමින් ඒවාට දමමින් හිටියා. හැබැයි ඒ වෙලාවේ සුකී පේන්නවත් හිටියේ නෑ. මම දැක්කා මිදුලේ තිබුණු සූරියකාන්ත පැළේ ලස්සන ලොකුම ලොකු මලක් පිපිලා තියනවා. මම දුවගෙන ගිහින් ඒ මල අල්ලන්න පහත්වුණා විතරයි කොහේදෝ ඉඳලා සුකී දුවගෙන ඇවිත් මල් පඳුර මුලට පැන්නා. මම බය වෙලා පස්සට පැන්නා. එයා ටික වෙලාවක් එතන පෙරෙළෙමින් දැඟලුවා මම හොඳින් බලනවිට දැක්කා පුස් පැටියා සර්පයෙක් එක්ක රණ්ඩු කරනවා. මොහොතකින් එයා මල්පඳුරෙන් එලියට ඇවිත් මගේ දිහා වීරයෙක් වගේ බලාගෙන හිටියා. තවත් මොහොතකින් එයාගේ ඇස් මලානික වෙන්න ගත්තා, එතනම බිම වැතිරුණා.




“තාත්තා” “තාත්තා” මම හයියෙන් කෑ. ගැසුවා තාත්තා දුවගෙන ආවා.“ඇයි පුතේ මොකද මේ කලබලේ” “අනේ මගේ පූස් පැටියා, එයා මාව බේරගන්න මේ සර්පයත් එක්ක රණ්ඩු කළා ” සර්පයා ඒ වෙනකොට එකතැන පෙරළෙමින් හිටියා. තාත්තා පූස් පැටියා අරගෙන හොඳින් බැලුවා “මෙයාගෙ කකුලකට දෂ්ට කරලා වගේ ” අපි මෙතනට උඩින් රෙදිපටියක් බැඳලා ඉක්මනින්ම බෙහෙත් ගන්න ගෙනියමු” තාත්තා එහෙම කියලා කකුල රෙදිපටියකින් තදින් වෙලලා පූස් පැටියා පෙට්ටියක දාගෙන කාර් එකෙන් තියාගෙන ඉක්මනින්ම පශු වෛද්‍ය මාමා  ළඟට අරගෙන ගියා.



අම්මා කොපමණ දේ කිව්වත් තාත්තාගෙන් ඇමතුමක් ලැබෙන තුරු මට හැඬීම නතර කරගන්න බැරි වුණා. තාත්තාගෙන් අපිට ඇමතුමක් ආවා.

“පුතේ බයවෙන්න එපා ඉක්මනින්ම ගෙනාපු නිසා පූස් පැටියාව සනීප කරන්න පුලුවන් කියලා දොස්තර මාමා කිව්වා”

මගේ සතුට නිමක් නැතිවූවා මම හයියෙන් කෑ ගැසුවා “අනේ මගේ සුකී ආයෙත් ගෙදර එනවා. ”



# පසු වදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීම සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්ව පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන්ට ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නවමාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟා වීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගෙ` හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම් කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතිකතලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් හා පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

**''දිවිය දිනන විද්‍යුත් පොතක් ''** ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරියක වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023/11/01